රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
பதிவாளர் நாயகம் திணைக்களம்
REGISTRAR GENERAL'S DEPARTMENT

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. RG/AB/23/වා.ස්.මා./2025 | ප්‍රධාන කාර්යාලය / தலைமை அலுவலகம் / HEAD OFFICE | තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 565 |
| ඔබේ අංකය / உமது இல. / Your No. | 234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල. / 234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை. / 234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla. | දිනය / திகதி / Date 2024.11.18 |

අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්

ප්‍රාදේශීය ලේකම්වරුන්

ප්‍රධාන කාර්යාලයේ සියලුම අංශ භාර මාණ්ඩලික නිලධාරීන්

පළාත්/කලාප භාර නියෝජ්‍ය/සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්

මධ්‍යම ලේඛනාගාරය භාර නියෝජ්‍ය/සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්

දිස්ත්‍රික් භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්

ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්

**රෙජිස්ට්‍රාර් සේවය II පන්තිය (ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්)/රෙජිස්ට්‍රාර් සේවය III පන්තිය I හා II ශ්‍රේණිය (අතිරේක දිස්ත්‍රික්/ අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර්)/ ලේඛන සහකාර සේවය/ පොත් බැඳුම්කරු සේවය යන සේවාවන්හි නිලධාරීන්ගේ වාර්ෂික ස්ථානමාරු - 2025**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අංක 2310/29 හා 2022.12.14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII පරිච්ඡේදයේ 251 වගන්තියේ විධිවිධාන හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කළ යුතුව ඇත.

02. එම විධිවිධාන අනුව 2025 වර්ෂයේ වාර්ෂික ස්ථානමාරු ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ යටතේ සිටින ඉහත සඳහන් සේවාවන්හි නිලධාරීන්ගෙන් ස්ථානමාරු අයදුම්පත් කැඳවනු ලැබේ. ස්ථාන මාරු කමිටු 2024.12.20 දිනට පෙර රැස්වීමට නියමිත බැවින් එම අයදුම්පත් ලේඛනගත කර සම්පූර්ණ කර වාර්ෂික ස්ථාන මාරු කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුව ඇත. එබැවින් එම නිලධාරීන් විසින් සම්පූර්ණ කර ඉදිරිපත් කරනු ලබන ස්ථාන මාරු අයදුම්පත් හී ඔබගේ නිර්දේශය පැහැදිලිව සඳහන් කර 2024.12.03 දිනට පෙර මා වෙත ලැබීමට සලස්වන්න. එම වාර්ෂික ස්ථානමාරු අයදුම්පත් ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමේදී මේ සමඟ අමුණා ඇති උපලේඛන අංක (I) ("වාර්ෂික ස්ථානමාරු අයදුම්පත් උපලේඛන (විධායක නොවන) - 2025 වර්ෂය") ආකෘතියට අනුව අයදුම්පත්වල තොරතුරු ඇතුළත් කොට ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස දන්වා සිටිමි. ලිපිකවරයේ වම් පස "වාර්ෂික ස්ථානමාරු අයදුම්පත් (විධායක නොවන) - 2025" ලෙස සඳහන් කර, රෙජිස්ට්‍රාර් ජනරාල්, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, 234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල ලිපිනයට හා ***transferadr2322@gmail.com*** යන ඊමේල් ලිපිනයට නියමිත දිනට පෙර එවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි. නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත් සම්බන්ධව සලකා බැලීම නොකරන බවද වැඩිදුරටත් දන්වා සිටිමි.

03. ස්ථානමාරු අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ මේ සමඟ අමුණා එවන ආකෘතිය අනුවය. එම ආකෘතිය මගින් ඉදිරිපත් නොවන ස්ථානමාරු ඉල්ලීම් ප්‍රතික්ෂේප කරන බවද වැඩිදුරටත් දන්වමි. එක් සේවා ස්ථානයක අවුරුදු 05 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් විසින් ස්ථානමාරු අයදුම්පතක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.


| | | | |
|---|---|---|---|
| දුරකථන අංකය / தொலைபேசி இல. / Telephone No. 2889488, 2889489 | ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. 2889491 | වෙබ් අඩවිය / இணையத்தளம் / Website www.rgd.gov.lk | විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail rgd@sltnet.lk, rg@rgd.gov.lk |

04. තවද, එක් සේවා ස්ථානයක අවුරුදු 05 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් ඔබ කාර්යාලයේ වෙත්නම්, අනිවාර්යයෙන්ම ඔවුන් සියලුදෙනා පිළිබඳ නිරවද්‍ය තොරතුරු මෙ සමඟ අමුණා ඇති උපලේඛන අංක (II) ආකෘති පත්‍රයේ ඇතුළත් කර ඉදිරිපත් කිරීමට කටයුතු කරන්න. (එම නිලධාරීන්ගේ සත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම අනිවාර්ය බව අවධාරණය කරමි.)

04. (i) රෙජිස්ට්‍රාර් සේවයේ III/I සහ III/II ශ්‍රේණි සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ සේවා කාලය වසර 05 යනු එකම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයක වසර 05 ක් අඛණ්ඩව සේවය කිරීම හෝ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල කීපයක වසර 05 ක් අඛණ්ඩව සේවය කිරීම ලෙස සලකනු ලැබේ.

05. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අංක 2310/29 හා 2022.12.14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII පරිච්ඡේදයේ 251 වගන්තියේ විධිවිධාන හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධ කටයුතු සිදු කෙරෙන බැවින් මෙම ක්‍රියාවලියේදී එම විධිවිධානයන්ට අනුකූලව කටයුතු කරන මෙන් දන්වා සිටිමි.

ඩබ්.ආර්.ඒ.එන්.එස්. විජයසිංහ
රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
අංක. 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල

ඩබ්.ආර්.ඒ.එන්.එස්. විජයසිංහ
රෙජිස්ට්‍රාර් ජනරාල්
දුරකථන 889490-0112 :
ෆැක්ස් 889491-0112 :
විද්‍යුත් ලිපිනය : rg.rgdepartment@gmail.com

පිටපත්

01. ලේකම්, - කරු.දැ.ගැ.ස.
අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශය